" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 0112 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 0112 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுவான இலக்கம் / General Telephone - 0112 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/06(B)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2025.02.21

## <u>මූල්‍ය චක්‍රලේඛ 04/2025</u>

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තු වල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරී වල සභාපතිවරු (බ.ප.),
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

**<u>රජයේ ආයතන විසින් භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා ප්‍රසම්පාදනය කරනු ලැබීම සහ ඒ හා සම්බන්ධ ඊට අනුපාතික වන කරුණු පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 බස්නාහිර පළාත් සභාවට අදාළ කරගැනීම</u>**

රජයේ ආයතන විසින් භාණ්ඩ , වැඩ හා උපදේශන නොවන සේවා ප්‍රසම්පාදනය කරනු ලැබීම සහ ඒ හා සම්බන්ධ ඊට අනුපාතික වන කරුණු පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විමසා සිදුකරනු ලබන ඉදිරි සංශෝධනයන්ට යටත්ව බස්නාහිර පළාතට අදාල කරගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GOS/ADM/6/2/19-2025 හා 2025.02.20 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත.

02. එමෙන්ම මෙම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය **2025.01.01** දින සිට බස්නාහිර පළාත් සභාව තුළ වලංගු වන අතර, මෙම මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.4 "අදාල විෂය පථය" ට අනුව පහත පරිදි සංශෝධිත අධිකාරී සීමාවන් යටතේ කටයුතු කල යුතු බව කාරුණිකව දන්වමි.

එස්.එල්. ධම්මිකා කේ. විජයසිංහ,
ප්‍රධාන ලේකම්,
පළාත් මුදල් අමාත්‍යාංශ ලේකම් හා
පළාත් භාණ්ඩාගාර ලේකම්
බස්නාහිර පළාත.

දුරකතන : 0112-093416
ෆැක්ස් : 0112-092636
විද්‍යුත් ලිපිනය : accpay@cs.wpc.gov.lk

**පිටපත්:** 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී

**<u>අංක 01</u>**

අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.6 හි නිශ්චිතව සඳහන් කර ඇති අධිකාරී සීමාවන් අනුව, බස්නාහිර පළාත් සභා අරමුදලට අදාළව හා බස්නාහිර පළාත් සභා අරමුදලින් මුදල් විසර්ජනය වන බස්නාහිර පළාත් සභාව යටතේ වූ ව්‍යවස්ථාපිත අධිකාරීන් යටතේ ප්‍රසම්පාදනයට අදාළව ක්‍රියාත්මක විය යුතු ප්‍රසම්පාදන කමිටු සහ ඒ එක් එක් කමිටුව වෙත ඒ සඳහා වන අධිකාරී බලය පිරිනැමීම පහත සඳහන් පරිදි විය යුතු බව.

| අනු අංකය | ප්‍රසම්පාදන කමිටු වර්ගය | අධිකාරී බලය පිරිනැමීම |
|---|---|---|
| 1 | බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව | පළාත් භාණ්ඩාගාර ලේකම් |
| 2 | ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | පළාත් ප්‍රධාන ගණන් දීමේ නිළධාරි (පළාත් ප්‍රධාන ලේකම්) |
| 3 | පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | පළාත් අමාත්‍යාංශ ප්‍රධාන ගණන් දීමේ නිළධාරී (පළාත් අමාත්‍යාංශ ලේකම්) |
| 4 | පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | පළාත් අමාත්‍යාංශ ප්‍රධාන ගණන් දීමේ නිළධාරී (පළාත් අමාත්‍යාංශ ලේකම්) |
| 5 | පළාත් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | පළාත් අමාත්‍යාංශ ප්‍රධාන ගණන් දීමේ නිළධාරී (පළාත් අමාත්‍යාංශ ලේකම්) |
| 6 | පළාත් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | පළාත් අමාත්‍යාංශ ප්‍රධාන ගණන් දීමේ නිළධාරී / පළාත් ගණන් දීමේ නිළධාරි |

බස්නාහිර පළාත් සභා ඉංජිනේරු විෂය භාර නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ කාර්යය කටයුතු පහසු වනු පිණිස ප්‍රධාන ලේකම් විසින් පවරන ලද අධිකාරී බලය මත පහත සඳහන් ප්‍රසම්පාදන කමිටුද ක්‍රියාත්මක වේ.

| අනු අංකය | ප්‍රසම්පාදන කමිටු වර්ගය | අධිකාරී බලය ක්‍රියාත්මක කිරීම |
|---|---|---|
| 1 | පළාත් ඉංජිනේරු විෂය භාර නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | පළාත් ප්‍රධාන ගණන් දීමේ නිළධාරි (පළාත් ප්‍රධාන ලේකම්) |
| 2 | පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ ප්‍රසම්පාදන කමිටුව | බස්නාහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 3 | පළාත් ප්‍රාදේශීය ඉංජිනේරු ප්‍රසම්පාදන කමිටුව | බස්නාහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) / බස්නාහිර පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ |

මෙසේ පත්කරනු ලබන ප්‍රසම්පාදන කමිටු සඳහා අදාළ වන කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා වන අධිකාරී සීමාවන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.9 අනුව පහත පරිදි විය යුතු බව,

01) විවෘත තරඟකාරී ලංසු කැඳවීමේ පටිපාටිය (මාර්ගෝපදේශ සංග්‍රහය 3.1.1 , 3.1.2 , 3.1.3 , 3.1.4 ) හෝ සෘජු කොන්ත්‍රාත්කරණය (මාර්ගෝපදේශ සංග්‍රහය 3.1.6) හා ස්වකීය සේවකයින් හා උපකරණ යොදා වැඩ කරවීම (මාර්ගෝපදේශ සංග්‍රහය 3.1.7 ) යන පටිපාටි අනුගමනය කිරීමේදී


| Deputy Chief Secretary | Administration | Personnel & Training | Finance | Planning | Engineering | Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel: 011-2092606<br>Fax: 011-2092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel: 011-2092631<br>Fax: 011-2092647<br>dcspt@cs.wpc.gov.lk | Tel: 011-2092640<br>Fax: 011-2092636<br>csfinance@wpc.gov.lk | Tel: 011-2092532<br>Fax: 011-2092533<br>dsplancs@wpc.gov.lk | Tel: 011-2092501<br>Fax: 011-2092505<br>dsengcs@wpc.gov.lk | Tel: 011-2092628 |

(රු.මිලියන)

| බල අධිකාරිය | පළාත් අරමුදල් වලින් කරන කොන්ත්‍රාත්තු | විදේශ අරමුදල් වලින් කරන කොන්ත්‍රාත්තු |
|---|---|---|
| බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව | 750 ට වැඩි | 1500 ට වැඩි |
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | 750 දක්වා | 1500 දක්වා |
| පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව / පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ප්‍රසම්පාදන කමිටුව | 500 දක්වා | 800 දක්වා |
| පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව / ගොඩනැඟිලි අධ්‍යක්ෂ ප්‍රසම්පාදන කමිටුව/ ව්‍යවස්ථාපිත අධිකාරීන් | 250 දක්වා | 400 දක්වා |
| පළාත් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව / අධිකාරී ප්‍රසම්පාදන කමිටුව | 50 දක්වා | 100 දක්වා |

02) වෙළඳපල මිල සැඳහුම් ක්‍රමයේදී (මාර්ගෝපදේශසංග්‍රහය 3.1.5.) අනුගමනය කිරීමේදී පිළිපැදිය යුතු මූල්‍ය සීමා

| බල අධිකාරිය | වෙළඳ පළ මිල සැඳහුම් ක්‍රමය (මාර්ගෝපදේශ සංග්‍රහය 3.1.5) | පළාත් අරමුදල් යොදවනු ලබන කොන්ත්‍රාත්තු | විදේශ අරමුදල් යොදවනු ලබන කොන්ත්‍රාත්තු |
|---|---|---|---|
| ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | **වැඩ -** මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මිලියන 40 දක්වා | රු.මිලියන 40 දක්වා |
| | **භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා -** මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මිලියන 25 දක්වා | රු.මිලියන 25 දක්වා |
| පළාත් අමාත්‍යාංශ/නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ප්‍රසම්පාදන කමිටුව | **වැඩ -** මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මිලියන 30 දක්වා | රු.මිලියන 30 දක්වා |
| | **භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා -** මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මිලියන 20 දක්වා | රු.මිලියන 20 දක්වා |

| | | | |
|---|---|---|---|
| පළාත් දෙපාර්තමේන්තු/ ගොඩනැගිලි අධ්‍යක්ෂ/අධිකාරීන් ප්‍රසම්පාදන කමිටුව | වැඩ -<br>මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මිලියන 15 දක්වා | රු.මිලියන 10 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා -<br>මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මිලියන 15 දක්වා | රු.මිලියන 10 දක්වා |
| පළාත් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව/ අධිකාරීන් ප්‍රසම්පාදන කමිටුව | වැඩ -<br>මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මිලියන 05 දක්වා | රු.මිලියන 05 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා -<br>මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මිලියන 02 දක්වා | රු.මිලියන 02 දක්වා |
| පළාත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/පළාත් අමාත්‍යංශ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී | වැඩ -<br>මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මිලියන 02 දක්වා | |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා -<br>මුද්‍රා තැබූ මිල ගණන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීමෙන් | රු.මිලියන 1 දක්වා | |

03) වෙළඳපල මිල සැදහුම් ක්‍රමයේදී යොදා ගන්නා ඍජු මිලදී ගැනීම්- සුළු වටිනාකම් සහිත අලුත්වැඩියා වැඩ, භාණ්ඩ හා සේවා (මාර්ගෝපදේශ අංක 3.1.6)
(විදේශ අරමුදල් යෙදවුම් හෝ ශ්‍රී ලංකා රජයේ මුදල් යෙදවුම්)

| අධිකාරිය | සම්පූර්ණ කළ යුතු කරුණු | අධිකාරී සීමාව |
|---|---|---|
| පළාත් ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/පළාත් අමාත්‍යංශ ප්‍රධාන ගණන් දීමේ නිලධාරී/ ගණන් දීමේ නිලධාරී | වැඩ -<br>• මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.6 අඩංගු අවශ්‍යතා සපුරා ලීමෙන් | රු. 600,000.00 දක්වා |
| | භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා-<br>• මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.6 අඩංගු අවශ්‍යතා සපුරා ලීමෙන් | රු. 300,000.00 දක්වා |
| | වැඩ-<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායි නොවන විට<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායි බව පිළිබඳව ප්‍ර.ග.නි/දෙ.ප්‍ර සහතික විය යුතුය. | රු. 300,000.00 දක්වා |

| | | |
|---|---|---|
| | • මෙම අධිකාරිය ප්‍ර.ග.නි/දෙ.ප්‍ර ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර වෙනත් පුද්ගලයෙකු වෙත නොපැවරිය යුතුය. | |
| පළාත් ප්‍රධාන ගණන් දීමේ නිළධාරි/ පළාත් අමාත්‍යාංශ ප්‍රධාන ගණන් දීමේ නිළධාරි/ ගණන් දීමේ නිළධාරි | **සෘජුවම වෙළඳපොළෙන් භාණ්ඩ හා උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය**<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායි නොවන විට<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍ර.ග.නි/දෙ.ප්‍ර සහතික විය යුතුය.<br>• මෙම අධිකාරිය ප්‍ර.ග.නි/දෙ.ප්‍ර ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර වෙනත් පුද්ගලයෙකු වෙත නොපැවරිය යුතුය. | රු. 150,000.00 දක්වා |
| පළාත් අමාත්‍යාංශ ප්‍රධාන ගණන් දීමේ නිළධාරි/ ගණන් දීමේ නිළධාරි | **මෝටර්රථ සහ වෙනත් උපකරණ අලුත්වැඩියාව**<br>• තරඟකාරී ලංසු කැඳවීම පිරිමැසුම්දායි නොවන විට<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍ර.ග.නි/දෙ.ප්‍ර සහතික විය යුතුය<br>• රු.500,000/= ඉක්මවන අලුත්වැඩියාවන් සඳහා ප්‍ර.ග.නි. ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතුය. | රු. 500,000.00 දක්වා |
| ගණන් දීමේ නිළධාරි විසින් අධිකාරි බලය පවරන ලද පළාත් ප්‍රාදේශීය ප්‍රධානීන් හෝ අදාළ ඒකක භාර / අංශ භාරව කටයුතු කරන ප්‍රධානීන් | එක් දිනකදී එක් කටයුත්තක් සඳහා රුපියල් 20,000/= ක් නොඉක්මවන පරිදි සුළු වටිනාකම් සහිත උපකරණ ඇතුළුව භාණ්ඩ හා සේවාවන් මිලදී ගැනීම.<br>• එක් ලිත් මාසයක් තුළ සිදු කරනු ලබන එබඳු මිලදී ගැනීම්වල එකතුව රුපියල් 100,000/= නොඉක්මවිය යුතුය. | රු. 20,000.00 දක්වා |
| | මසකට රු. 100,000 නොඉක්මවන මෝටර් වාහන අලුත්වැඩියා කිරීම. | රු. 100,000.00 දක්වා |

04) ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැරවීම සඳහා අධිකාරී සීමාවන්

පළාත් අරමුදලින් කරන ප්‍රසම්පාදන වලදී ඉතා හදිසි වූද, ඉතා විශේෂවූද, කරුණු හේතු කොට ගෙන නියමිත ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරවීමට අවශ්‍ය වන විට, ඒ සඳහා බලය දීමට පහත සඳහන් සීමාවන්ට යටත්ව නිසි අධිකාර බලධාරීන්ට පිළිවන. එසේ වුවත් , එසේ බලය දීමේදී ඊට හේතු පැහැදිලිව ලියා විගණකාධිපති වෙත පිටපතක් යවා වාර්තා තබා ගත යුතුය.

| | | ප්‍රසම්පාදන කාර්යය පටිපාටියෙන් බැහැරවීමට අධිකාරී සීමාවන් (රුපියල් මිලියන) |
|---|---|---|
| 01 | වැඩ, භාණ්ඩ හා සේවා සඳහා පළාත් දෙපාර්තමේන්තු / පළාත් ගොඩනැඟිලි අධ්‍යක්ෂගේ ප්‍රසම්පාදන කමිටුව | 0.2 දක්වා |
| 02 | වැඩ, භාණ්ඩ හා සේවා සඳහා පළාත් අමාත්‍යාංශ/ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ප්‍රසම්පාදන කමිටුව | 08 දක්වා |
| 03 | වැඩ, භාණ්ඩ හා සේවා සඳහා ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | 10 දක්වා |
| 04 | වැඩ, භාණ්ඩ හා සේවා සඳහා බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව | 10 ට වැඩි |

05) කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර ප්‍රසම්පාදන කමිටුව විසින් කර ඇති නිර්දේශය/ නිර්ණය සඳහා පහත සඳහන් අධිකාරීන්ගෙන් අනුමැතිය ලබා ගත යුතුය.

| | ප්‍රසම්පාදන කමිටු වර්ගය | අධිකාරී බලය පිරිනැමීම |
|---|---|---|
| අ. | බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය පත් කල ප්‍රසම්පාදන කමිටුව | බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය |
| ආ. | ප්‍රධාන ලේකම් ප්‍රසම්පාදන කමිටුව | පළාත් ප්‍රධාන ගණන් දීමේ නිළධාරි (බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්) |
| ඇ. | පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | පළාත් අමාත්‍යාංශප්‍රධාන ගණන් දීමේ නිළධාරි |
| ඈ | පළාත් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | පළාත් අමාත්‍යාංශ ප්‍රධාන ගණන් දීමේ නිළධාරි |
| ඉ | පළාත් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | පළාත් ගණන් දීමේ නිළධාරි |
| ඊ | පළාත් ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | පළාත් ගණන් දීමේ නිළධාරි |


| Deputy Chief Secretary | Administration | Personnel & Training | Finance | Planning | Engineering | Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel: 011-2092606 Fax: 011-2092609 dcadmin@cs.wpc.gov.lk | Tel: 011-2092631 Fax: 011-2092647 dcpt@cs.wpc.gov.lk | Tel: 011-2092640 Fax: 011-2092636 csfinance@wpc.gov.lk | Tel: 011-2092532 Fax: 011-2092533 dsplancs@wpc.gov.lk | Tel: 011-2092501 Fax: 011-2092505 dsengcs@wpc.gov.lk | Tel: 011-2092628 |

අංක 02

අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.7.1 යටතේ වන ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව යන ඡේදයෙහි (අ) හි සඳහන් භාණ්ඩාගාර ලේකම් යන්නට පළාත් භාණ්ඩාගාර ලේකම් වශයෙන් හා අමාත්‍ය මණ්ඩලය යන්නට බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය හෝ අවස්ථාවෝචිත පරිදි පළාත් ආණ්ඩුකාර වශයෙන් සංශෝධනය විය යුතුය.

අංක 03

අදාළ මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 2.6 සඳහා යෝජිත එක් එක් ප්‍රසම්පාදන කමිටු සඳහා අධිකාරී සීමාවන් ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ නිර්ණායකයන්ට අනුව කලින් කල පළාත් අමාත්‍ය මණ්ඩලය හෝ බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් තීරණය කරන පරිදි අදාළ කරලීමට යොජනා කරන අතර ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩල නිශ්චිතව දක්වා ඇති පරිදි අදාළ අධිකාරී සීමාවන්ට අනුකූලව පත් කර ගන්නා බවද දැනුම් දෙමි.


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල් / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதம உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
| | Tel: 011-2092606 Fax: 011-2092609 dcadmin@cs.wpc.gov.lk | Tel: 011-2092631 Fax: 011-2092647 dcspt@cs.wpc.gov.lk | Tel: 011-2092640 Fax: 011-2092636 csfinance@wpc.gov.lk | Tel: 011-2092532 Fax: 011-2092533 dsplancs@wpc.gov.lk | Tel: 011-2092501 Fax: 011-2092505 dsengcs@wpc.gov.lk | Tel: 011-2092628 |